## 10. සිසු දිරිය පොත් ණය ව්‍යාපෘතිය

2018 වර්ෂයේ ආරම්භ කරන ලද මෙම ව්‍යාපෘතිය මඟින් සාමාජිකත්වයේ දූවා දරුවන්ගේ අධ්‍යාපනික කටයුතු සඳහා අවශ්‍ය කරන පාසල් පොත් සහ උපකරණ වට්ටම් සහිතව සහනදායි මිල ගණන් යටතේ එකවර ගෙවීමකින් තොරව මිලදී ගැනීමේ පහසුකම් සලසා ඇත. එමඟින් පාසල් පොත් සහ උපකරණ මිලදී ගැනීමේදී මුහුණදෙන්නා වූ ආර්ථික දුෂ්කරතාවයන්ට සහනයක් වීමට හා අත්වැලක් වීමට අපට හැකිවී ඇත.
සාමාජිකත්වයේ දැඩි ඉල්ලීම මත 2025 වර්ෂය දක්වා අඛණ්ඩව වර්ෂ 8 ක් සාමාජිකත්වයේ දූ දරුවන් සඳහා පාසල් පොත් සහ උපකරණ ලබා දීමේ වැඩසටහන සාර්ථකව ක්‍රියාත්මක කිරීමට අපට හැකි විය.

ඒ අනුව පහත උපකරණ සාමාජිකත්වය වෙත ලබා දී ඇත.

1. පාසල් පොත්
2. පාසල් උපකරණ
3. පාසල් බෑග්
4. වතුර බෝතල්
5. කෑම පෙට්ටි
6. DSI Vouchers.